# සුදු කිකිළියි

# රතු කිකිළියි



කතාව සහ චිත්‍ර : බුද්ධිමාලි හංසනි හේරත්

**කෘතියේ නම :** සුදු කිකිළියි රතු කිකිළියි

**ප්‍රථම මුද්‍රණය :** 2025 - ජනවාරි - 03

**කතාව සහ චිත්‍ර :** H. M. බුද්ධිමාලි හංසනී හේරත්

**කතෘගේ ලිපිනය :** "ජයසෙවන",
උඩගම,
අම්පිටිය,
මහනුවර.

**පාසල :** මහාමායා බාලිකා විදුහල

**ශ්‍රේණිය :** 2 fY%Ksh E

**ISBN - 978-624-208-391-9**

# පිදුම

මෙම පොත සෑදීමට
උදව් උපකාර කල
මගේ ආදරණීය
දිල්රුක්ෂි ගුරු
මෑණියන්ටත්, මවටත්
පියාටත්, මහමාය විදු
මෑණියන්ටත්
ගෞරවයෙන්
පුදමි..........

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මතින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ර්ට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක්තරා ගොවිපලක
කිකිළියෝ දෙදෙනෙක්
ජීවත් වුණා. මේ
දෙන්නාගෙන් රතු කිකිළි
හරිම කඩිසරයි. ඒ වුණාට
සුදු කිකිළි නම් හරිම
කම්මැලියෙක්. දවසක්
උදේම රතු කිකිළි මිදුල
අතුගානකොට මුං
ඇටයක් හම්බුණා.




ඉතින් රතු කිකිළි මේ මුං ඇටේ පැල කලා. පොහොරයි වතුරයි දාලා මුං පැලේ පරිස්සමෙන් බලා ගත්තා. හැබැයි සුදු කිකිළි නම් මේ කිසි දේකට උදව් කළේ නැහැ. පැත්තකට වෙලා නිදාගෙන හිටියා.



දවස් ගානකට පස්සේ මූං
පැලයේ මල් පිපිලා
කරල් එන්න ගත්තා.
"අපි මූං කරල් කඩමු"
කියලා රතු කිකිළි සුදු
කිකිළිට කතා කලත් සුදු
කිකිළි ගණන් ගත්තේ
නැහැ.



අමාරුවෙන් මූං කරල්
කඩපු රතු කිකිළි
ඒවායින් ඇට වෙන්
කලා. මූං ඇට
ගෝනියකටත් දැම්මා.
"මූං ගෝනිය ගෙට
ගෙනියන්න මට උදව්
වෙන්න" කියලා
ඉල්ලුවත් සුදු කිකිළි
ඇහුනේ නැහැ වගේ නිදා
ගත්තා.



මූං ඇට කිරිබත් උයන්න හිතපු රතු කිකිළි සුදු කිකිළිට කතා කළා. සුදු කිකිළි තවමත් නිදි. ඉතින් රතු කිකිළි මූං ඇට හෝදලා මුට්ටියකට දැම්මා.



"මට ලිප පත්තු කරන්න උදව් වෙන්න" රතු කිකිළි කීවා. ඒත් තාම සුදු කිකිළි නිදි. හැමදේම තනියම කරපු රතු කිකිළි පොල් ගාලා පොල් මිරිකලා කිරි ටික මුට්ටියට දැම්මා.



ඔන්න මූං කිරිබත් හැදිලා ඉවරයි. ගේ පුරාම මූං කිරිබත් සුවඳ පිරිලා. එකපාරටම නැගිටපු සුදු කිකිළි "අපි කිරිබත් කමු" කියලා කීවා. ඇහුනේ නැහැ වගේ හිටපු රතු කිකිළි " ඒකට මට ඔයාගේ උදව් එපා" කියල තනියම මූං කිරිබත් කෑවා.

ඉතින් මේ කතාවෙන් පැහැදිලි වන්නේ කම්මැලියාට කිසිම හොඳ දෙයක් ලැබෙන්නෙ නැහැ කියන කතාවයි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ හාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය හික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුහවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත නවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග හාවිතයට එක්වීමත් සමද දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසද, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුහාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්